L

Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2018/07/05 |
|---|---|---|

පැමිණිලිකාරිය : ඒ. බී. වින්ධ්‍යානි මිය.
22 සී. මේට්ලන්ඩ් චන්ද්‍රවංකය.
කොළඹ 07.

වගඋත්තරකරුවන් : 01. ලේකම්.
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

02. අධ්‍යක්ෂ (ජාතික පාසල්).
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

03. විදුහල්පති.
රාජකීය විද්‍යාලය.
කොළඹ 07.

<u>පැමිණිලි අංකය : **HRC/290/18**</u>

පැමිණිලිකාරියගේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිලිකාරිය විසින් 2018-01-23 වන දින සිය පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම දරුවා වන එන්.ටී.ගවිනු මෙන්තිල නම්බුකාර දරුවා 2018 වර්ෂයේ කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුලත් කිරීම සඳහා සේවා අවශ්‍යතාව මත සිදුකරන ලද ස්ථාන මාරු වීම යටතේ (RC/S/18/2017) අයදුම්පත්‍රයක්




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ඉදිරිපත් කර සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ලකුණු 95ක් උපයා ගත් බවත්, පාසලට ඇතුලත් කිරීමේ අවම ලකුණු සීමාව 69 වුවද තම දරුවා පාසලට ඇතුලත් කර නොගත් බවයි.

පැමිණිලිකාරියගේ ස්ථානීය පරීක්ෂණය සඳහා වගඋත්තරකාර විද්‍යාලය විසින් 2017-10-06 වන දින රාත්‍රී 7.30ට පමණ නිවසට පැමිණ බවත්, නිවසේ සිටින බවට සනාථ කර පැමිණිලිකාරියගේ අත්සනද ලබාගෙන අදාල වගඋත්තරකරුවන් පිටව ගිය බවත් පැමිණිලිකාරිය කොමිෂන් සභාවට වැඩිදුරටත් කරුණු දක්වා ඇත.

තවද, 2017-10-24 වන දින නැවතත් වගඋත්තරකාර විද්‍යාලයේ නිලධාරින් විසින් පළමු මහලේ පදිංචි වී සිටින වෙනත් පාර්ශවයකගේ ස්ථානීය පරීක්ෂණයට පැමිණි අවස්ථාවේදී මෙම වගඋත්තරකරුවන් දෙවන මහලේ ජීවත් වන තමා පිළිබඳව විමසීමක් සිදු කර ඇති බවත්, නමුත් ඒ වන විට පැමිණිලිකාරිය රාජකාරි ස්ථානීය වන බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ ප්‍රධාන පරිපාලන නිලධාරිනිය ලෙස සේවය කරන බැවින් හා එදින රාජකාරි කරන දිනයක් වන බැවින් තමා නිවසේ නොසිටි බවත් සඳහන් කර ඇත. ඒ අනුව එදින ස්ථානයේ නොසිටි බැවින් තමාගේ දරුවාට පාසලට ඇතුලත් කර ගැනීමේ අවස්ථාව අහිමි වී ඇති බව පැමිණිලිකාරිය කොමිෂන් සභාවට දන්වා ඇත.

03 වන වගඋත්තරකරු වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය විදුහල්පති අශෝක මහතාගේ කරුණු දැක්වීම. :-

වගඋත්තරකරු කොමිෂන් සභාවට දන්වා ඇත්තේ, අදාල අයදුම්කාරිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිනය යොදා ගෙන තවත් අයදුම්පත්‍රයක් අදාල විද්‍යාලයට ඉල්ලුම් කර ඇති බවයි. ඒ අනුව එකම ලිපිනයෙන් රාජකීය විද්‍යාලයට දරුවන් දෙදෙනෙකු ඇතුලත් කර ගැනීමේ ප්‍රශ්නකාරී තත්ත්වයක් මතුවන බවත්, ස්ථානීය පරීක්ෂණය සිදු කිරීමේදී පැමිණිලිකාරිය 2017-10-06 වන දින තම නිවසේ රැඳී සිටි බවට කරුණු අනාවරණය වන බවත් දක්වා ඇත. දෙවන ඉල්ලුම්කරුගේ ස්ථානීය පරීක්ෂණය සඳහා 2017-10-24 වන දින පෙ.ව.11.30ට සිදු කිරීමට ගිය අවස්ථාවේදී එම පැමිණිලිකරු එම ස්ථානයේ නොසිටි බවත් ඉන් අනතුරුව මෙම පැමිණිලිකාරියගේ ස්ථානීය පරීක්ෂණය නැවත සිදු කල බවත් ඒ අවස්ථාවේදී පැමිණිලිකාරිය නිවසේ නොසිටි බවට කරුණු අනාවරණය වූ බවත් වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

තවද, ස්ථානීය පරීක්ෂණයේදී මෙම නිවස බිම් මහල, පළමු මහල සහ දෙවන මහල වශයෙන් නිරීක්ෂණය වී ඇති බව කොමිෂන් සභාව හමුවේ කරුණු දක්වා ඇත. එකම ලිපිනය සඳහන් කර ඉල්ලුම්කරුවන් දෙදෙනෙකු තම දරුවන් අප විද්‍යාලයට ඇතුලත් කිරීම සඳහා අයදුම්පත්‍ර යොමු

කර ඇති නමුත්. එය තෝරා ගැනීමේ ගැටළුවක් මතු වූ බැවින්. අදාළ පැමිණිලිකරුවන් දෙදෙනාගේ දරුවන් පාසලට ඇතුළත් කර නොගත් බව කොමිෂන් සභාවට දන්වා ඇත.

තවද පැමිණිලිකාරිය සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ලකුණු 95ක් උපයාගෙන ඇති අතර පාසලට ඇතුළත් කිරීමේ අවම ලකුණු සීමාව 69 බවත්. ඉහත ගැටළුකාරී තත්ත්වය මත පැමිණිලිකාරියගේ දරුවා පාසලට ඇතුළත් කර නොගත් බවත් වගඋත්තරකරු කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත.

කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු :

පැමිණිලිකාරිය සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරුවීම් පදනම යටතේ අදාළ පාසලට ඉල්ලුම් පත්‍රයක් යොමු කර ලකුණු 95ක් උපයාගෙන ඇති අතර පාසලට ඇතුළත් කර ගැනීමේ අවම ලකුණු සීමාව ලකුණු 69ක් වේ. 2017-10-06 වන දින ස්ථාන පරීක්ෂණ අවස්ථාවේදී පැමිණිලිකාරිය නිවසේ පදිංචි වී සිටින බවට තහවුරු වී ඇති බවට දෙපාර්ශවයේ කරුණු අනුව පෙනී යයි.

තවද වගඋත්තරකරුවන් විසින් ස්ථානීය පරීක්ෂණයේදී මෙම නිවස බිම් මහල. පළමු මහල සහ දෙවන මහල වශයෙන් නිරීක්ෂණය වී ඇති බව වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ වලින් පැහැදිලි වේ. පැමිණිලිකාරිය 22/සී. නිවසේ දෙවන මහලේ පදිංචි වී ඇති බවට නිරීක්ෂණය වන අතර පදිංචිය තහවුරු කිරීමට 2017-10-06 වන දින රාත්‍රී 7.30 ට පැමිණි අවස්ථාවේදී එය තහවුරු වී ඇති බවද නිරීක්ෂණය වේ. නමුත් 2017-10-24 වන දින පෙ.ව.11.30ට පළමු මහලේ ඉල්ලුම්කරුගේ නිවස පරීක්ෂා කිරීමෙන් පසු වගඋත්තරකරුවන් ඉහත පැමිණිලිකාරියගේ නිවසද පරීක්ෂණයට භාජනය කළ නමුත්. ඇය එවිට නිවසේ නොසිටි බවට වගඋත්තරකරුවන් දක්වා ඇතත්. ඒ අවස්ථාවේදී පැමිණිලිකාරිය රාජකාරි කරන බැවින්. රාජකාරි ස්ථානයේ සිටි බවට පැමිණිලිකාරියගේ ප්‍රකාශයෙන් කරුණු අනාවරණය වේ. එම කාරණය ප්‍රායෝගිකව සිදු විය හැකි තත්වයක් වන බව නිරීක්ෂණය වන අතරම මහල් තුනකින් යුතු නිවසක් එක් එක් මහල වෙන් වෙන්ව බදු ලබා දීමද ප්‍රායෝගිකව විය හැකි තත්වයක් බවද කොමිෂන් සභාවේ නිරීක්ෂණය වේ.

දෙපාර්ශවයේ විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති කරුණු අනුව පැමිණිලිකාරිය සේවා අවශ්‍යතා මත ස්ථාන මාරු වීම ලබා ගෙන අදාළ වගඋත්තරකාර විද්‍යාලයට ඉල්ලුම් පතක් ඉදිරිපත් කර ලකුණු 95 ක් සම්මුඛ පරීක්ෂණයේදී ලැබී ඇති බවත්. පාසලට ළමුන් ඇතුළත් කිරීමේ අවම ලකුණු 69 ක් වන අතර. 2017-10-06 වන දින නිවසේ පදිංචි වී ඇති බවට කරුණු අනාවරණය වී ඇති බැවින්ද දෙවන දිනය වන එනම් 2017-10-24

වන දින පෙ.ව11.30ට ස්ථානිය පරිසෂණයට ගිය අවස්ථාවේදී පැමිණිලිකාරිය නිවෙස් රැඳි නොසිටි බවත්. එදින රජයේ රාජකාරි කරන දිනයක් බැවින් පැමිණිලිකාරිය සේවයට ගොස් ඇති බවට කරුණු නිරික්ෂණය වේ. තවද මෙම නිවස මහල් තුනකින් සමන්විත නිවසක් බවට අදාල වගඋත්තරකරුවන් කොමිෂන් සභාව හමුවේ කරුණු අනාවරණය කර ඇත.

පැමිණිලිකාරිය විසින් දෙවන මහලේ පදිංචි වී සිටි බවට 2017-10-06 වන දින ස්ථානිය පරිසෂණයෙන් තහවුරු වී ඇති අතර. ඒ අනුව අදාල පැමිණිලිකාරියගේ දරුවාට වගඋත්තරකාර විද්‍යාලයට ඇතුලත් වී අධ්‍යාපන කටයුතු හැදෑරීමට නියමිත සුදුසුකම් සපුරා ඇති බවට කරුණු නිරිසෂණය වී තිබියදීත් දරුවා පාසලට ඇතුලත් කර නොගැනීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට ආරක්ෂා කර දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට පරික්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව පැමිණිලිකාරියගේ දරුවා වන එන්.පී.ගවිනු මෙත්නිල තම්බුකාර දරුවා 2018 වර්ෂයේ කොළඹ රාජකිය විද්‍යාලයේ පළමු වසරට ඇතුලත් කර ගන්නා ලෙසට නිර්දේශ කරනු ලැබේ.

2018.03.15 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka

සභාපති.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත :-

1. ලේකම්. අධ්‍යාපන අමාත්‍යාංශය.
   ඉසුරුපාය. බත්තරමුල්ල.

2. ගරු අමාත්‍ය අකිල විරාජ් කාරියවසම මහතා.
   අධ්‍යාපන අමාත්‍යංශය. ඉසුරුපාය. බත්තරමුල්ල.

B/